# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2107/48 - 2019 ජනවාරි මස 25 වැනි සිකුරාදා - 2019.01.25**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*මගේ අංකය :* KDS/MDB/4/2/1/71/24.

*ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ යොමු අංකය :*13/96/FR/505.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

නකල්ස් රක්ෂිතය සඳහා ඉඩම් අත්කර ගැනීම

*ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ/පරවශතාවේ විස්තර:*

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, මැදදුම්බර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, උඩසියපත්තුව කෝරළේ සුළු කොට්ඨාසයේ මාංගොඩ (806) ග්‍රාම නිළධාරී වසමේ මාංගොඩ ගමේ පිහිටි, මහනුවර ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරීගේ මූලික පිඹුරු අංක මහ 6735 හා 2018.01.19 දිනැති පිඹුරේ කැබලි අංක 01 වශයෙන් පෙන්නුම් කර ඇති ප්‍රමාණයෙන් හෙක්ටයාර් 4.0168 ක් වූ අගුරුපොලවත්ත නැමැති ඉඩම්:

01. කැබලි අංක 01
ඉඩමේ නම: අගුරුපොලවත්ත; ඉඩමේ විස්තරය: කැලය; හිමිකම් කියන අය:මාංගොඩ මැදමහනුවර පදිංචි එච්.එම්.මුතුබණ්ඩා; ප්‍රමාණය:හෙක්. 4.0168.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් 2019 අප්‍රේල් මස 24 වැනි දින පෙ.ව. 10.00ට මැදදුම්බර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද 2019 අප්‍රේල් මස 17 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

ඒ. එම්. වික්‍රමාරච්චි,
ප්‍රාදේශීය ලේකම්,
මැදදුම්බර.

2019 ජනවාරි මස 23 වැනි දින,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
මැදදුම්බර.

02-381



මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.